ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1980 අංක 39 දරන
# කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1980 ඔක්තෝබර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : ශත 45 යි | තැපැල් ගාස්තුව ශත 35 යි

# 1980 අංක 39 දරන කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 58/79.

**කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

"කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියළු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා කුලියාපිටියේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ කරගෙන ගොස් ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ප්‍රදානය කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1980 අංක 39 දරන කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.**

**2.** මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමයේ තත් කාලයේ පාලක මණ්ඩලයේ සභාපති, උප සභාපතිවරු සහ සාමාජිකයන් ද සංගමයේ දැනට සාමාජිකයන් වූ සියළු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද, "කුලියාපිටිය තරුණ බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් වන්නාහ. එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියළු අධිකරණවල නඩු පැවරීම හා පවරනු ලැබීම කළ හැකි හා කළ යුතු වන්නේ ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ සහ අලුතු කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දක්වෙන පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) බෞද්ධ ධර්මය අධ්‍යයනය කිරීම, පිළිපැදීම හා ප්‍රචාරය කිරීම ;

(ආ) බෞද්ධයන් අතර එක්සත්කම, සහයෝගිතාවය හා සහෝදරත්වය දිරි ගැන්වීම හා වැඩි දියුණු කිරීම ;

(ඇ) සංගමයේ සාමාජිකයන්ගේ ශාරීරික, බුද්ධිමය හා සමාජයීය ශුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඈ) පොදු සමාජ සේවය.

2—ඒ 43693—9,025 (79/08)

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයේ හෝ සියළු ක්‍රියා කිරීමේද සියළු කරුණු ඉටු කිරීමේ සහ සියළු දේ ක්‍රියාත්මක කිරීමේ බලය ද සංස්ථාවට තිබිය යුතු ය.

පාලක මණ්ඩලය.

5. (1) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන නිලධරයන්ගෙන් සහ වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් ද සමන්විත පාලක මණ්ඩලයක් මගින් සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතුය.

(2) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය මේ පනත ආරම්භ වන දින ධුර දරන සංගමයේ පාලක මණ්ඩලයේ නිලධරයන්ගෙන් සහ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද පාලක මණ්ඩලයේ සහ සංස්ථාවේ නොයෙකුත් නිලධරයන්ගේ සහ අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය කරගෙන යාම සඳහා ද, සභා රැස්වීම් කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ද සංස්ථාවේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමකදී වැඩි ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසු (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව, එවැනි රැස්වීමකදී, එකී රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(2) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන කිසිම රීතියක් හෝ වෙනස් කිරීම. සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ ඊට යමක් එකතු කිරීම, හෝ සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතුය.

(3) මේ පනත ආරම්භ වන දින බලපවත්නා සංගමයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතුය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් වන්නාහ.

7. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා සංගමයේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට ලැබිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය. — සංගමයෙන් ගෙවිය යුතු හා සංගමයට අය විය යුතු ණය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු බූදල් බෑහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීම නීතිය අනුව සංස්ථාවට හැකියාව හා ශක්තතාව ඇත්තේ ය. තව ද එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බෑහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතුය. — සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ තබාගත හැකි බව.

9. සභාපතිවරයා සහ එක් සමලේකම්වරයකු හෝ භාණ්ඩාගාරික වරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි නම නම් අත්සන් කළ යුතුය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතුය. — සංස්ථාවේ මුද්‍රාව.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිති වාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. — ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් තෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොහැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොඑවීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.